**පාඨමාලා සංකේතය :** BUPH E3015

**වර්ගය:** C

**මාතෘකාව:** මහායාන දර්ශනය, තර්ක ශාස්ත්‍රය හා බෞද්ධ ඥාන මීමාංසාව.

**අරමුණු හා අභිප්‍රේතාර්ථ :**

බෞද්ධ දර්ශන ඉතිහාසයෙහි පසුකාලීන ප්‍රමුඛතම දාර්ශනික චින්තන ධාරව වූ මහායාන බුදුසමයෙහි මූලධර්ම හා දාර්ශනික ප්‍රවණතා පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබාදීමටත්, භාරතීය චින්තාවන්ට සාපේක්ෂව බෞද්ධ ඥාන මීමාංසාව හා තර්ක ශාස්ත්‍රය පිළිබඳ විචාරාත්මක අවබෝධයක් ලබදීමටත් අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් ඵල :**

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම තුළින් විද්‍යාර්ථීයා බෞද්ධ චින්තනයේ ථෙරවාදී නොවන දාර්ශනික ප්‍රවණතා පිළිබඳ ප්‍රබුද්ධ ආකල්පයක් වර්ධනය කරගන්නා අතර, ඉන්දීය චින්තන සම්ප්‍රදායයන්ට සාපේක්ෂව බෞද්ධ ඥාන මීමාංසාව හා තර්ක ශාස්ත්‍රය උපයෝගී කොටගෙන යමක් පිළිබඳ නිවැරදිව සිතීමේ හා වටහා ගැනීමේ ශක්‍යතාව වර්ධනය කරගනියි.

**පාඨමාලා අන්තර්ගතය :**

මහායාන බුදු සමය ප්‍රභවයට අදාළ දාර්ශනික පසුබිම, බෝධිසත්ව පරමාදර්ශය, පාරමිතා, බෝධි චිත්තය,දශභූමි, බුද්ධ සංකල්පය හා ත්‍රිකාය සංකල්පය, මාධ්‍යමික දර්ශනයේ ප්‍රභවය, ප්‍රධාන ඉගැන්වීම්, ප්‍රමුඛ ආචාර්යවරු හා ප්‍රාමාණික කෘති, යෝගාචාර විඥානවාදයේ ප්‍රභවය, මූලික සිද්ධාන්ත, ප්‍රමුඛ ආචාර්යවරු හා මූලික ධර්ම ග්‍රන්ථ, බාහිර ලෝකයේ පැවැත්ම පිළිබඳ මාධ්‍යමික හා යෝගාචාර ඉගැන්වීම්, තාන්ත්‍රික බුදුසමය,අනුමාන ශබ්දයෙහි භාවිතය, බෞද්ධ න්‍යාය ශාස්ත්‍රීය ග්‍රන්ථවල එන අනුමානය පිළිබඳ අර්ථනිරූපණ, ත්‍රිරූප ලිංගය, ස්වාර්ථානුමානය, පරාර්ථානුමානය, හේත්වාභාස, චතුෂ්කෝටි ප්‍රයෝගය හා අපෝහනය,අනුස්සවය හා තර්කය පිළිබඳ බෞද්ධ විචාරය, ඉන්ද්‍රියප්‍රත්‍යක්ෂය, අනුභූතිවාදී ප්‍රවණතා, ද්විසත්‍යවාදය හා එහි ඥානමීමාංසාත්මක පදනම.

**ක්‍රමවේදය :**

අත් පත්‍රිකා, අධ්‍යයන මාර්ගෝපදේශන හා සම්මන්ත්‍රණ.

**ඇගයීම් ක්‍රමය:** වර්ෂාවසානයේදී පැවැත්වෙන පැය 03ක ලිඛිත පරීක්ෂණය, අධ්‍යයන සම්භාර 05කි. ලකුණු සියයකි.

**නිර්දේශිත කියවීම්:**

සාසනරතන හිමි, මොරටුවේ. (1970). *මාධ්‍යමික දර්ශනය, 1 සහ 2.* පානදුර.

රාහුල හිමි, අත්තුඩාවේ. (1970). *මහායානය.* නුගේගොඩ.

ඤාණාවාස ස්ථවිර, හේන්පිටගෙදර. (1964).*විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය*, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

තිලකරත්න, අංසග. (2001). *ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය.*නුගේගොඩ.: තිමිර ප්‍රකාශන,

මේධානන්ද හිමි, දේවාලේගම. (1976). *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය.*කොළඹ.

නානායක්කාර, සනත්. (1995).*මුල් බුදුසමයේ සිට වජ්‍රයානය දක්වා.* දෙහිවල.

ඤාණසීහ හිමි, හේන්පිටගෙදර. (1960). *ශූන්‍යතා දර්ශනය.* පැල්මඩුල්ල.

ගුණරත්න, ආර්.ඩී. (1983). *නවීන තර්ක ශාස්ත්‍රය හා භාරතීය තර්ක ශාස්ත්‍රය*. කොළඹ.

Stcherbatsky, F. (1962).*Buddhist Logic 1 and II*. New York.

Wayman, Alex. (1999). *A Millennium of Buddhist Logic*. Delhi.

Jayatilela, K.N. (1963). *Early Buddhist Theory of Knowledge*. London.

Conze, E. (1962). *Buddhist Thought in India*. London.

Dayal H. (1932). *The Boddisattva Doctrine in Buddhist SanskritLiterature*. London.

Dutt, N. (1989). *Mahayana Buddhism*. Singapore.

Murti, T.R.V. (1998).*The Central Philosophy of Buddhism*. Delhi.

Dutt, N. (1978). *Buddhist Sects in India*. Delhi.